ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>මහ කොමසාරිස්තුමාගේ දකුණු පළාත් සංචාරය</u>

මෑත කාලයේ දී විශේෂ දකුණු පළාත් සංචාරයක නිරත වූ ප්‍රථම ඉන්දීය මහ කොමසාරිස්වරයා බවට පත් වෙමින් මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා 2024 මාර්තු 6-7 දිනවල ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල විවිධ නියැළීම්වල නිරත විය.

2. මහ කොමසාරිස්තුමා 2024 මාර්තු 6 වන දින දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ මහතා හමු වූ අතර එහිදී එතුමා පළාත තුළ ඉන්දියානු රජය විසින් ක්‍රියාවට නංවා ඇති විවිධ ව්‍යාපෘතීන් පිළිබඳව සඳහන් කළේය. ප්‍රදාන මෙන්ම ආයොජන හරහා පළාතේ ජනතාවගේ යහපත සඳහා තවත් ව්‍යාපෘතීන් සිදු කිරීමට කැමැත්ත ද මහ කොමසාරිස්තුමා විසින් මෙහිදී ප්‍රකාශ කරන ලදී. ආණ්ඩුකාරතුමා ඉන්දීය රජය විසින් ක්‍රියාවට නංවා ඇති විවිධ මුලපිරීම් සම්බන්ධයෙන් මහ කොමසාරිස්තුමා හට සිය ස්තුතිය පළ කළේය.

3. මහ කොමසාරිස්තුමා රුහුණු විශ්ව විද්‍යාලයේ ගුරුදේව් රවින්ද්‍රනාත් තාගෝර් ශ්‍රවණාගාරයේ ස්ථාපිත රවින්ද්‍රනාත් තාගොර්තුමාගේ උඩුකය පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීය. 1500ක පිරිසකට අසුන් ගත හැකි මෙම ශ්‍රවණාගාරය ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක ඇති විශාලතම ශ්‍රවණාගාරයයි.

ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ ඉදි කළ මෙම ශ්‍රවණාගාරය 2018 වසරේදී විවෘත කරන ලදී. විශ්ව විද්‍යාලයේ උප කුලපතිතුමා සහ පීඨාධිපතිවරුන් සමඟ පැවති හමුවක දී මහ කොමසාරිස්තුමා වඩා සමීප අධ්‍යාපනික සහයෝගීතාවයන් සඳහා උනන්දුව ප්‍රකාශ කළ අතර විවිධ අයුරින් විශ්ව විද්‍යාලයට තවදුරටත් සහය ලබා දීමට කැමැත්ත පළ කළේය.

4. ඉන්දීය රජය ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ගම්මාන 50ක් පමණ ආවරණය කරමින් නිවාස ව්‍යාපෘතීන් දෙකක් ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යාපෘති දෙක යටතේ ඉන්දීය රජය නිවාස නොමැති, ඉඩම් නොමැති සහ අඩු ආදායම්ලාභී ජනතාව සඳහා නිවාස 1200ක් ඉදි කිරීමට කැප වී ඇත. මහ කොමසාරිස්තුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්මාන 2ක සංචාරයක නිරත වෙමින් මෙම නිවාස ව්‍යාපෘති වැඩබිම් දෙකක ප්‍රගතිය නිරීක්ෂණය කළේය.

5. මහ කොමසාරිස්තුමාගේ දකුණු පළාත් සංචාරය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින අචල සංස්කෘතික සබඳතා අවධාරණය කරයි. මහ කොමසාරිස්තුමා දෙවුන්දර, කතරගම සහ තිස්සමහාරාම විහාරස්ථාන වැඳපුදා ගත් අතර ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර සබඳතා වඩා ශක්තිමත් වේවා යැයි ප්‍රාර්ථනා කළේය.

***

***කොළඹ***
***2023 මාර්තු 7***